**මේ වසරේ පුරාවිද්‍යා දිනයේ තේමාව**

# උරුමය සුරැකුම වේ අප යුතුකම

මෙවර පුරාවිද්‍යා දිනයේ තේමාව ඉහත සඳහන් වේ. අතීතයේ අපගේ මුතුන්මිත්තන් විසින් අප වෙත භාරදුන් මේ අප ගේ අතීත උරුමය අනාගත පරපුර සඳහා රැක දී ඒවා ඊටත් වඩා හොඳින් අවබෝධ කරගෙන ඒ අනාගත පිරිසටත් අවබෝධ කරදී ඒ පුරාවස්තු ඒ අනාගත පරපුරට සුරැකීම භාරදීමේ වගකීම පැවරී ඇත්තේ මේ යුගයේ ජීවත්වන මේ අපගේ පරම්පරාවට බව අප අමතක කළයුතු නොවේ. මේ වගකීමෙන් කිසිසේත්ම කිසිදු පුරවැසියකුට මගහැරීමට නොහැකි ය. ඔහු හෝ ඇය තරුණවිය හෝ මහලුවියේ හෝ වෙනත් විශේෂිත වූ ක්ෂේත්‍රයක හෝ දේශපාලනඥයකු හෝ ගුරුවරයකු, නීතිඥයකු, වෛද්‍යවරයකු, පාසල් දරුවකු ආදී මෙකී නොකී සෑම කෙනෙකුගේම යුතුකම වන්නේ මේ අප සතු ජාතික උරුමය රැකගැනීමයි. අප ඒවා රැක ගන්නේ කුමක් සඳහා ද අපේ ඊළඟ පරපුර සඳහා යි. ඒ පරපුරේ ද යුතුකම වන්නේ ඊළඟ පරපුරට ඒ අපේ උරුමය රැක දීමයි. මේ නිසා මේ වසරේ පුරා විද්‍යා දිනයේ තේමාව ලෙසින් එය යොදාගෙන ඇත.



ක්‍රි. ව. 12 සියවස –
පොළොන්නරුව ගල් විහාරය

# පුරා විද්‍යා දිනය හා ජාත්‍යන්තර පුරා විද්‍යා සමුළුව



ක්‍රි. ව. 12 සියවස – පොත්ගුල් විහාර ප්‍රතිමාව පොළොන්නරුව

මෙවර පුරාවිද්‍යා දිනය යෙදී ඇත්තේ ජූලි මස 7 වැනිදට ය. ජාතියක් සතු පුරාවස්තු එම රටේ වසන සකල පුරවැසි ජනතාවගේ ම අනන්‍යතාව ලොවට හඬගා කියන මිල කළ නොහැකි වූ වස්තුවකි. මේ පුරාවස්තු හා පුරා විද්‍යා ස්ථාන සුරැකීමේ වගකීම රාජ්‍ය ආයතනයක් වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට පැවරී ඇත. 1940 පුරාවිද්‍යා ආඥපනත මගින් සම්මත වූ පරිදි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මූලික කාර්යය භාරය පුරාවිද්‍යා ආඥපණත ක්‍රියාවට නැංවීම ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර සියයක් සම්පූර්ණ වූයේ 1990 ජූලි මස 7 වැනිදට ය. එනම් මීට වසර දහයකට ඉහත දී ය. මීට වසර දහයකට ඉහත දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිහිටුවා වසර සියයක් සපිරීම වෙනුවෙන් පුරාවිද්‍යා සමුළුවක් කොළඹ හිල්ටන් හෝටලයේ දී 1990 ජූලි මස 8 වැනිද සිට සතියක්ම පැවැත් වුණි. මෙම අන්තර්ජාතික පුරාවිද්‍යා සමුළුව සඳහා පුරාවිද්‍යාඥයින්, ඉතිහාසඥයින්, මානව විද්‍යාඥයින්, වාස්තු විද්‍යාඥයින් හා ශිලා ලේඛනඥයින් ද රටවල් විස්සකින් සහභාගි වූයේ ය.

මේ අවස්ථාවේ දී ඒ ඒ රටවලින් පැමිණි (ලංකාවත් ඇතුළු) ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳ වූ විශේෂඥතා ඇති විද්වතුන් විසින් පර්යේෂණ පත්‍රිකා සිය ගණනක් මෙම ජාත්‍යන්තර සමුළුව සඳහා ඉදිරිපත් කරන ලදී. එම ලිපි සියල්ලම ඉංග්‍රීසි බසින් ඒන්ෂන්ට් සිලෝන් (ANCIENT CEYLON) 7, 8, 9, 10, 11 හා 12 යන ග්‍රන්ථ හයෙහි ප්‍රකාශයට පත් කර ඇත.

මෙම සමුළුවෙන් පසු වර්ෂයේ සිට පුරාවිද්‍යා දිනය සෑම වසරකම ජූලි මස 7 වැනිද පැවැත්විය යුතු බවට රජය විසින් නිල ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ඒ සඳහා හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරුන් වන ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතාත්, ඇම්. එච්. සිරිසෝම මහතාත් පුරෝගාමී වූබව සඳහන් කළ යුතුව ඇත.

මේ පිළිබඳ විශේෂ උනන්දුවකින් අභාවප්‍රාප්ත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් ඇම්. එච්. සිරිසෝම මහතා කටයුතු කලේ ය. එම අගය මේ සඳහා යොද ගැනීමට හේතු වී ඇත්තේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ප්‍රථම පුරාවිද්‍යා කොමසාරිස්වර එච්. සී. පී. බෙල් මහතා විසින් අනුරාධපුරයේ දී ආරම්භ කරන ලද්දේ 1890 ජූලි මස 7 වැනිද නිසා ය.

ඒ වසරේ සිට මේ දක්වා පුරා විද්‍යා දිනය පිළිබඳ ජනතාවගේ අවධානය යොමු කිරීමේ වැඩසටහනක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කර ඇත.